
# පුංචි මලීට පාඩමක්



නිවිලි ශෙනර්‍යා කරුණාරත්න

# පුංචි මලීට පාඩමක්

නිව්ලි ශෙනර්‍යා කරුණාරත්න

# පුංචි මලීට පාඩමක්

කතෘ ප්‍රකාශනයකි

නිව්ලි ශෙනර්‍යා කරුණාරත්න

6 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මුද්‍රිත දිනය

කතෘගේ වෙනත් කෘතීන්

**ගී රස**
ප්‍රථම මුද්‍රණය - 2019.10.28
වෙළුම් කාණ්ඩය - පළමු වෙළුම

**උඩඟු රන් අශ්වයා**
දෙවන මුද්‍රණය - 2020
වෙළුම් කාණ්ඩය - දෙවන වෙළුම

ISBN - 978-624-208-406-0

# පිදුම

සැමදා සිප් සතර උගන්වන

යහ ගුණ කියා දෙන

මල්කාන්ති හේරත්

ගුරු මෑණියන් හට

හද පිරි සෙනෙහසින් හා

භක්තියෙන්

මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද  නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද  සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම   සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින්  ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක කාලෙක පුංචි පවුලක් ජීවත් වුණා. ඒ පවුලෙ හිටියෙ පුංචි මලී සහ එයාගේ අම්මයි තාත්තයි.



පුංචි මලී ඉගෙන ගන්න හරිම
දක්ෂයි. හැම පාරම වාර විභාගයේ
පන්තියේ වැඩිම ලකුණු අර ගත්තා.
පන්තියේ පලවෙනියා වුනේ ද මලී.



මලී හොඳට ඉගෙන ගන්න නිසා අම්මයි, තාත්තයි ගොඩක් සතුටු වුණා. අම්මයි තාත්තයි මලීට තෑග්ගක් අරන් දෙන්න හිතුවා. මලීට ලැබුන තෑග්ග වුණේ පරිගණකයක්. පුංචි මලීට ගොඩාක් සතුටුයි.





මලි පරිගණකයට ඇබ්බැහි වුණා.
අම්මයි තාත්තයි කියන දේ ටිකක්
වත් ඇහුවේ නෑ. පාඩම් කරෙත් නෑ.
මලීට පාසලේ වැඩ ගොඩක් අතපසු
විය. පරිගණකය දිහාම බලාගෙන
කාලය ගත කළා.

නැවතත් පාසලේ වාර විභාග දින ළං විය. මලී දැන් ඉස්සර වගේ පාඩම් වැඩ කරන්නේ නෑ. අම්මා කතා කරත් මලීට ඇහුණේ නෑ. අම්මයි තාත්තයි ගොඩක් දුක් වුණා.



පාසලේ වාර විභාගය දිනය ආවා. මලී පාසල් ගියා. විභාගය මුහුණ දුන්නා. ඒත් මලීට කිසිම දෙයක් මතක නෑ. මලී කිසිවක් ගණන් නොගෙන වෙනදා මෙන් පරිගණකයේ නියලී සිටියා.



ටික දිනකට පසු විභාග ප්‍රතිපල ආවා. මලී පන්තියේ අන්තිමයා. ලකුණු හොඳටම අඩුයි. අම්මයි තාත්තයි ගොඩක් දුක් වුණා.





අම්මයි තාත්තයි තීරණය කරා මලීගේ පරිගණකය අයින් කරන්න. පරිගණකය අයින් කරා. පුංචි මලී ගොඩක් ඇඬුවා.

අම්මා මලීට හැමදේම පැහැදිලි කරලා දුන්නා. මලී හැමදේම තේරුම් ගත්තා.

මලී නැවතත් ඉස්සර වගේ පාඩම් කරන්න පටන් ගත්තා. හොඳින් විභාගයට මුහුණ දෙන්න සිතා ගත්තා. මලී අධිෂ්ඨාන කර ගත් විදියට විභාගය සමත් වුණා.

වැඩි ම ලකුණු ගෙන පන්තියේ පලවෙනියා වෙන්න මලීට පුළුවන් වුණා.



අම්මයි, තාත්තයි මලීට අවවාද කරලා නැවතත් පරිගණකය දුන්නා. මලී හැමදේම සමබරව කරගෙන යන්න තීරණය කළා. මලී හොඳින් ඉගෙන ගත්තා.

අම්මටයි තාත්තටයි කීකරු හොඳ ළමයෙක් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්